# නොසැලෙන මිතුදම



විශ්මි රසාංගිකා දිසානායක

කෘතියේ නම - A friendship that Never dies

ප්‍රථම මුද්‍රණය - 2023.12.11

කතාව සහ චිත්‍ර - විශ්මි රසාංගිකා දිසානායක

කතෘගේ ලිපිනය - අංක 14/3
3නේ කණුව
අම්පිටිය

පාසල - මහා මහමායා බාලිකා විදුහල
මහනුවර

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය E

පරිගණක අක්ෂර සහ පිටු සැකසුම - ACP printers
අංක 14
තුනේ කනුව
අම්පිටිය

ISBN No: 978-624-208-073-4

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැංවීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාව හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය පොතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවන් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් **"දිවිය දිනන විද්‍යුත් පොතක්"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතේට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල්

දරුවන් අතර විද්‍යුත් පොත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි .

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි වේග ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියටද ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු .

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට ස්තුතියි මෙමගින් පිරිනමමි .

සසිකලා සේනාධීර,
විදුහල්පතිනි,
මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.11.01

ළමා සාහිත්‍ය කටයුතුවලදී දිවි දීමෙන් ළමා ලොව සුරැකීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන මහනුවර මහමායා බාලිකා විදුහල හා ගුරු මණ්ඩලයට ගෞරවනීය ස්තුතිය පළමුව පුදකරමි.

විශ්මි රසාංගිකා දිසානායක වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි බලාපොරොත්තු වෙමි.

කර්තෘ විශ්මි රසාංගිකා දිසානායක
ස්ථිර ලිපිනය
අංක 14/3, තුනේ කණුව,
අම්පිටිය,
මහනුවර
දුරකථන අංකය 076-3502555

“I love it when you call me senorita......
I wish I could pretend I didn't need ya.....
But every touch is ooo.... La la la.....
It's true La la la....
Ooo.... I should be running,
Ooo..... You know i love it,
I love it when you call me senorita....
I wish it wasn’t so......”

Principle: “stop singing those songs”

මේ විදියට මහ හයියෙන් මුළු ඉස්කෝලෙම දෙවනත් වෙන්න හිස් period එකෙක සින්දු කියමින් සිටියේ 9 B ශ්‍රේණියේ ඉන්න මුරන්ඩුම ළමයි සෙට් එක. ඉතින් හිතපු නැති විදිහට principle madam ගේ පැමිණීම නිසා මේගොල්ලන්ගේ සින්දුවට උනේ ලොකු බාදාවක් වගේම ඊළගට මේගොල්ලන්ට වැටෙන්න යන්නේ ලොකු ප්‍රශ්නයක්.

Principle -: මොකක්ද මේ පන්තියට වෙලා තියෙන්නේ? මං දැන් මේ ළමයින්ට කීපාරක් කිව්වද හිස් period වල දඟ වැඩ නොකර පොතක් බලාගන්න කියලා? ජෙනිෆර් තමුන්! ජෙනිෆර් ඔයා ලගදීම මේ ඉස්කෝලෙන් අස් වෙන්න ඉන්නේ, තමුන් ඒ ඉස්කොලෙටත් ගිහින් මේ විදියටද හැසිරෙන්න හදන්නේ? හොදයි දැන් හැමෝම punishment එක විදියට office එක ඉස්සරහට ගිහින් දනගහ ගන්නවා! “Senorita...... Nonsense”

ජෙනිෆර්.....! ජෙනිෆර් කියන්නේ, මුරණ්ඩු කිසිම දෙයක් වැඩිය ගණන් ගන්නේ නැති ඒත් සමහර වෙලාවට තද මෙන්ම සංවේදී හිතක් තිබුණු සෙල්ලක්කාර චරිතයක්, ඔව් ජෙනිෆර් මේ ලෝකේ වැඩියෙන්ම කැමති උනේ එයාගේ ආච්චි, යාළුවොයි එක්ක කාලය ගත කරන්න. වෛද්‍යවරු දෙදෙනෙකුගේ එකම දියණිය උණු ජෙනිෆර් ට කුඩා කාලයේ ඉදන්ම ලොකු අවදානයක් දෙන්න එයාගේ දෙමව්පියන්ට බැරි උනා, ඒක නිසා ජෙනිෆර්

තමන්ගේ අම්මටයි තාත්තටයි මුරණ්ඩු වෙන්න ගත්තා. ඒත් එයා මුරණ්ඩු නොවන එක කෙනෙක් හිටිය, ඔව් ඒ තමයි එයාගේ ආච්චි. පුංචි කාලේ ඉඳන්ම ජෙනිෆර් ව බලාගත්තේ එයාගේ ආච්චි. ඉතින් එයාගේ මුළු ලෝකෙම උනේ එයාගේ ආච්චි. හදිස්සියේම ජෙනිෆර් ගේ අම්මටයි තාත්තටයි ලැබුන transfer එක නිසා ජෙනිෆර් ට සිද්ද වෙනවා එයාගේ ඉස්කෝලෙන් අස් වෙලා කොළඹ ඉස්කෝලෙට යන්න. මුලදී මේ වැඩේට ජෙනිෆර් කොච්චර අකමැති උනත් ආච්චිගේ කීම නිසාම ජෙනිෆර් මේකට කැමති වෙනවා. ඔව් ජෙනිෆර්ට මේ ලෝකේ දෙයක් හොඳින් තේරුම් කරලා දුන්නු එකම කෙනත් එයාගේ ආච්චි විතරයි. ජෙනිෆර් කොච්චර මුරණ්ඩු උනත් එයාට හොඳ හදවතක් තිබුනා.

Ket -: ජෙනිෆර්, දැන් ඉතින් ඔයා ඉස්කෝලෙන් අස් උනාම අපිවත් අමතක් වෙයි නේ?

Jeniffer -: Are you crazy?.... ඒකනම් කවදාවත් වෙන්නේ නෑ. ඔය බත් කට මෙහෙට එවනවකෝ.

ඔව් පැය බාගයක් office එක ඉස්සරහ දනගහගෙන ඉඳල ඇවිත් history period එකේ මැඩම්ට හොරෙන් බත් කන ගමන් තමයි මේගොල්ලෝ හිටියේ, ඒත් අවාසනාවකට මේක history madam අතටම අහුවෙනවා.

H:M -: මොකක්ද ඔතන වෙන්නේ මොකක්.....? Interval ඒක තිබ්බේ දැන් ටිකකට කලින් නේද මේ මොකද ඔයගොල්ලන්ට වෙනම time table එකක්ද ඉස්කෝලේ තියෙන්නේ?

හරිම අවාසනාවන්ත විදියට මෙයාලගේ හොර වැඩේ අද පලවෙනි වතාවට මැඩම්ට මාට්ටු වෙන්නේ interval එක වෙලාවේ මෙයාලට කෑම කන්න නොවී office එක ඉස්සරහ දන ගහන් හිටිය කියන එකත් මැඩම්ට කියන්න බැරිකමට මේගොල්ලන්ට අයෙත් පාරක් පන්තිය ඉස්සරහ දනගහන් ඉන්න වෙනවා.

Ket -: මං කිව්වා සෙසු ඔයාට බත් එක උඩින් එවන්න එපා කියලා, කො ඇහුවේ නෑ නේ.

Jennifer :- හරි හරි guyz වෙච්ච දේ උනානේ දැන් මොනා කරන්නද ඕක අතැරලා දාන්න.

Sesu -: මේ ජෙනී ඔයාට අලුත් ඉස්කෝලෙදි නම් මේ වගේ fun ගන්න බැරි වෙයි, අපිටත් ඔයා නැතුව ගොඩක් පාලු හිතෙයි. කොළඹ ඉස්කෝලෙට ඔයාට යන්නම ඕනිද?

Jennifer -: මට නම් යන්න ඔනිකමක් නෑ. ඒත් ඉතින් මොනා කරන්නද මාත් කැමති නෑ ඔයාලව දාල යන්න. Ane guys, තව ටික දවසක් මං මේ ඉස්කෝලේ ඉන්නවා නේ ඉන්න ටිකේ fun එකේ ඉමු. ඒ දවස ගැන පස්සේ හිතමු, මේ ඒක නෙමේ පට්ට බඩගිනි guyz, යමුද කැන්ටිම පැත්තට, මේ මේ principle ඔය හරියේ පොඩ්ඩක් ඉන්නවද බලන්න, නැත්නම් අපිට කෑගහලම එයාට heart attack හැදිලා නවතින්නේ.

Soya :- අම්මෝ ඔව් ඒක නම් ඇත්ත. මේ ඉක්මනට යමු නැත්නම් මෙතන හාමතේ මැරෙන්නේ, එහෙනම් කට්ටියම ඔලුව පාත් කරන් shape එකේ යමු එහෙනම්.

ටිකෙන් ටික සතියක් ගෙවී ගිහින් Jennifer මේ ඉස්කෝලෙන් අස් වෙන දවසත් ආවා. ඒ දවස Jennifer ට වගේම Jennifer ගේ යාලුවන්ටත් ගොඩක් දුක්බර දවසක් උනත් ගුරුවරුන්ට නම් පුංචි සතුටක් ඇති උන දවසක්. ඔව් ඉස්කෝලේ මොකක්හරි දග වැඩක් තිබුනොත් එතන Jennifer කියන නම අනිවාර්යයි!.... ඒත් ඉස්කෝලේ Maths මැඩම්ටත් මේ දවස ගොඩක් දුක්බර දවසක් මොකද Jennifer කියන්නේ මැඩම්ගේ හොඳම ගෝලයෙක් වගේම Jennifer කියන්නේ Maths වලට ගොඩක් දක්ෂ ළමයෙක්

Principle :- ඇත්තටම Jennifer අපේ ඉස්කෝලේ බාහිර කටයුතු වලට වගේම අනික් වැඩ වලටත් ගොඩක් සහබාගී වෙලත් තියෙනවා. හැම test එහෙකම වගේ Maths වලට 90 න් ඉහල marks අරන් තියෙනවා. ඒත් මෙයා අනිත් subjects වලට නම් ගොඩක් දූර්වලයි. Jennifer ගේ දෙමව්පියෝ විදියට මෙයාගේ පාඩම් වැඩ ගැන මීට වඩා සැලකිලිමත් වෙන්න. ඒ වගේම මෙයාගේ දඟ වැඩත් බොහොම වැඩි. ඒ දෙවල් නම් මට කියලා ඉවරකරන්න බැරි වෙයි. මෙයාගේ හැසිරීමත් මීට වඩා හොද තත්වෙක තියෙන්න ඕනි.

Principle Madam මේ දේවල් Jennifer ගේ අම්මාටයි තාත්තාටයී කියද්දීත් Jennifer හීටියේ පෑනක් කරකව කරකව එයාගේ යාලුවෝ ගැන කල්පනා කර කර, ඔව් යාලුවෝ දාලා යන්න වෙන එක ගැන Jennifer ට තිබුනේ ලොකු දූකක් මොකද Jennifer ට ගැලපෙනම අය හිටියේ එයාගේ ඉස්කෝලේ.

සහෝදරයෙක් වත් නැති Jennifer ට තමන්ගේ අම්මා යී තාත්තා යී කරපු මේ වැඩේ නිසා එයාගේ තරහා තවත් වැඩි වුණා මිසක් අඩු උනේ නෑ. එත් Jennifer කට වහන් ඉවසගෙන හිටියා මොකද Jennifer කොච්චර කිවත් එයාගේ අම්මා යී තාත්තා යී මේක වැඩිය ගණන් ගන්නේ නෑ කියලා Jennifer දන්නවා. එත් යාලුවෝ නැති උනත් තමන්ගේ ආච්චි හරි එයා ළඟ ඉදිවී කියන විශ්වාසය නිසා Jennifer මේ දේට අකමැත්තෙන් වුනත් කැමති වෙනවා. Principle Madam Jennifer ට හුගක් අවවාද දීලා එයාට සුභ පතලා එයාගේ අස්වීම් සහතිකේ එයාගේ අතට දෙද්දී Jennifer ට දැනුනේ ලොකු දූකක්. එත් මොනා කරන්නද Jennifer office එකෙන් එලියට එද්දි කදුළු පුරෝවාගෙන එතන හිටියේ එයාගේ යාලුවෝ යී. Maths ටීචර් යී.

Sesu -: අනේ ජෙනියෝ කවදාවත් අපිව අමතක කරන්නේ නෑ නේද, ඔයාට එහිදී හොඳ යාළුවෝ හම්බුනත් අපිව හැමදාම මතක තියාගන්න ජෙනී අපිටත් කවදාවත් ඔයත් එක්ක කරපු පිස්සු වැඩ නම් අමතක වෙන්නේ නෑ

Jennifer :- අනේ ඔව් ජෙනි ඔයා ඒ ඉස්කෝලෙට ගිහින් හොඳට ඉගෙනගෙන හොඳ යාළුවෙක් එක්ක හොඳින් ඉන්න තේරුණාද?

Jennifer :- අනේ guys අඬන්න එපා ඔයාලා දන්නවා මං අඬන බබාලට කැමති නෑ කියලා.

Ket -: අනේ ජෙනී අපි හැමදාම ඔයා කියන දේ ඇහුවා ඒත් අද නම් අඬන්න එපා කියන්න එපා. Sorry Please අපිව බලලා යන්න අනිවාර්යෙන් දවසක එන්න හරිද?

M.T :- ඔව් පුතේ ඔයා කොච්චර දඟ වුණත් ඔයා කියන්නෙ මට හම්බුනු දක්ෂම ළමයෙක් ඔයා ගොඩක් හොඳ දරුවෙක් වගේම ඔයාට ලස්සන අනාගතයක් තියෙනවා. ඒක නිසා ඔයා අලුත් ඉස්කෝලෙටත් ගිහින් හොඳට ඉගෙන ගන්න ජෙනිෆර් පුතේ God Bless You

A.F. :- Good Bye and God Bless You Jennifer Plz අපිට කවදාවත් අපව අමතක කරන්න එපා අනිවාර්යයෙන් දවසක අපිව බලන්න එන්න.

Jennifer :- අනිවාර්යෙන් මට කවදාවත් ඔයාලව අමතක කරන්න බැරි වෙයි Good bye guys.

හිතේ ලොකු දුකක් හිර කරන් ජෙනිෆර් එයාගේ යාලුවන්ට සමුදුන්නේ කඳුළු අමාරුවෙන් හිර කරගෙන

මෝටර් රථයේ ජනේලයට හේත්තුවෙලා ලොකු කල්පනාවක ගිලිලා හිටියේ ජෙනිෆර් අවදි වුනේ එයාගේ අම්මගේ කටහඬින්.

Mom:- ජෙනිෆර් ඔයා ඔයාගේ බඩු සේරම ගත්තද?

Jennifer :- ඔව්

Mom:- එකක්වත් අමතක වුණේ නෑනේ?

Jennifer :- නෑ නෑ

Mom:- මොකද ජනිෆර් ඔයා ඔය තරම් තරහින්

Jennifer :- එහෙම එකක් නෑ

Mom:- එහෙනම් ඇයි ඔයා තරහින් කතා කරන්නේ.

Jennifer :- මං දන්නෙ නෑ

ජෙනි .........ඔයා හොඳටම දන්නවා අපි ඔයාව ඉස්කෝලෙට දැම්මේ තාවකාලිකව කියල මොකද ඔයා ඔය ඉස්කෝලෙදි ගොඩක් දඟ වැඩ කරලා ඉස්කෝලෙන් ඔයාව අස් කරගන්න කියලා principle මට හුගක් සැරයක් කිව්වා. දැන්වත් අලුත් ඉස්කෝලෙදි ඔය දඟ වැඩ නවත්තන්න ජෙනිෆර් ඔයා නිසා අපිට තවත් බැනුම් අහන්න බෑ .
ජෙනිෆට මේ වචන හැම එකක්ම වගේ හොඳට පුරුදුයි. ඒත් මේ වචන නිසා ජෙනිෆගේ හිත නොරිදුනාමත් නෙමෙයි. ඒත් ආච්චි ජෙනීෆාව ළඟට අරන් තුරු කරගත්තු නිසා ජෙනිෆර්ගේ හිත හුඟක් දුරට හැදුනා.
කෙමෙන් කෙමෙන් ඔවුන් ඔවුන්ගේ නිවස කරා පැමිණියහ. ගෙදර බඩු අස් කරාට පස්සේ ජෙනිෆර් ගියේ එයාගේ ආච්චිව හම්බවෙන්න.

ආච්චි මොකද කරන්නේ

මොකුත් නෑ ජෙනී මං බණ පොත් වගයක් බැලුවා.

ජෙනිෆර් ඇවිත් ආච්චිගේ ඔඩොක්කුවේ ඔලුව තියාගත්තා. ආච්චි කණ්ණාඩි දෙක ගලවලා ජෙනිෆර්ගේ ඔලුව අතගෑවා.
ආච්චි ඇයි මගේ අම්මයි තාත්තයි මේ තරම් ආර්ථමාර්තකාමී.

ඇයි ජෙනි ඔයා එහෙම අහන්නේ?

ඒගොල්ලෝ මං ගැන හිතුවානම් ඇයි මාව මෙහෙ ගෙනාවේ. ඒගොල්ලෝ හිතන්නේ ඒගොල්ලන්ගේ රස්සාව ගැන විතරයි.
අනේ ජෙනිෆයි ඒගොල්ලො ඔයාට නරකක් කරේ නැහැ. අනික ඒගොල්ලො ඔයාව ගෙනත් දැම්මේ කොළඹ ලොකු ඉස්කෝලෙකට. ඒ ඔයාගේ ඉගෙනීම වෙනුවෙන් මේ අහන්න පුතේ ඒගොල්ලෝ ඩොක්ටර්ස්ලා ඔයා දන්නවද ඒගොල්ලන්ගේ අතේ ජීවිත ගොඩක් රැඳිලා තියෙනවා. මගේ ඇස් දෙක පවා මේ වෙද්දි තියෙන්නේ ඩොක්ටර්ස්ලා දෙන බෙහෙත් නිසා මොකද මාත් Eye patient කෙනෙක් නැත්නම් මටත් කවදාවත් ඔයාව දකින්න ලැබෙන එකක් නෑ ජෙනී ෆර් ඒත් මට විශ්වාසයි ඔයාට මේ ඉස්කෝලෙදිත් ගොඩක් හොඳ යාළුවෝ හම්බවෙයි .

Hum....... අපි එහෙමවත් හිතමුකෝ ................

හරි ජෙනිෆර් ගෙදර ඉන්නත් කම්මැලි නිසා නරකද ඔයා චුට්ටක් අර අපි එද්දි දැකපු පාක් එකට ගිහින් ආවොත් සමහරවිට ඔයාට ඔයාගේ ඉස්කෝලෙ අලුත් යාලුවෙක් උනත් හම්බෙන්න පුළුවන් එහෙනම් පරිස්සමින් ගිහින් එන්න .

ආච්චිගේ අදහසට එකඟ වුණු ජෙනීෆර් බයිසිකලෙත් අරන් ගියේ තමන්ගේ හිත නිදහස් කරගන්න මිසක් අලුත් යාළුවෙක් හොයාගන්න නම් නෙමෙයි. මොකද ජෙනීෆර් තාමත් එයාගේ පරණ යාළුවො මතක් වුණා. එයාට අලුත් යාළුවෙක් ගැන හිතන්න අදහසක්වත් කැමැත්තක් වත් තිබුණේ නෑ .පාක් එකටත් ගිහින් වටපිට බල බලා කල්පනා කර කර හිටපු ජෙනීෆර් දකින්නේ හරිම පුදුම දෙයක.ඔව් එයා දකිනවා ලොකු කන්ටේනර් එකක් එන පැත්තට ඇවිදගෙන යන ළමයෙක්ව ඩ්‍රයිවර්ට ඒ ළමයව පෙනුනේ නෑ. ඒත් ජෙනීෆර්ට

මේක හිතාගන්න බැරි වුණා. එයාට හිතුණා මේක කාගේහරි විහිලුවක් ද කියලා ඒත් ඒ කන්ටේනර් එක එන්න එන්නම අර ළමයට ලං වෙන නිසා ජෙනිෆර්ට තේරුණා වෙන්න යන්නේ හොඳ දෙයක් නෙමෙයි කියලා .
ඒ සැණින් ක්‍රියාත්මක වුණු ජෙනීෆර් ඒ ළමයා ළඟට බයිසිකලයෙන් ගියේ හීයක වේගයෙන් බයිසිකලෙන් පැනලා අර ළමයවත් තල්ලු කරන් පාරෙන් එහා පැත්තට පැනපු ජෙනිෆර් ටික වෙලාවකින් ආයෙමත් ඒ පැත්ත බැලුවේ ආපු ලොකු සද්දෙ නිසා

ඔව් මේ වෙද්දිත් කන්ඩේනර් එක ජනීෆර්ගේ බයිසිකලේ හැප්පිලා ඒක කෑලි කෑලි වලට කැඩිලත් ඉවරයි එයා පුංචි කාලේ ඉඳන් පැදපු මේ බයිසිකලේ දැන් තියෙන විදිහ දැක්කම ජෙනීෆර්ට දැනුනේ ලොකු දුකක් වගේම තරහා ඔව් ඒ අර ළමයා ගැන ජෙනීෆර් එයා දිහා බලද්දි තමයි දැක්කේ. එයාගේ කඳුළු පිරුණු ඇස් දෙක ඒ කඳුළු දැක්කම ජෙනීෆර් වුට්ටක් සන්සුන් වුණත් එයාගේ තරහේ ලොකු අඩුවක් වුනේ නෑ
ඒ මොකද තමුන්ට මැරෙන්න ඕනි වෙලාද අර වාහනේ ඉස්සරහට ගියේ? මොළයක් කියල දෙයක් නැද්ද ඇත්තටම තමුන්ට .
ඇයි ඔයා මව බේරගත්තේ මට කවුරුත් ආදරේ නෑ ඒක නිසා මට ජීවත් වෙන්න බෑ .
ඒ වචන කියාගෙන ඒ ළමයා අඬාගෙන යන්න ගිය දිහා ජෙනීෆර් බලන් හිටියේ කිසි දෙයක් හිතාගන්න බැරුව හැමදේම හීනයක් කියලා ජෙනීෆර් හිතුවත් ඒක එහෙම නෑ කියලා හිතෙන ලොකුම හේතුව ජෙනීෆර්ගේ බයිසිකලේ

සේරම එකයි උදව්වක් කරලත් බැනුම් අහන්න උනා. හරියට මං පලි වගේනේ කමක් නෑ මං කරපු දේ මටත් තියෙයිනේ
කියලා හිතපු ජෙනීෆර් කැඩුණු බයිසිකලේ දිහා බලලා පයින්ම ගෙදර යන්න ගියේ ගොඩක් දුකින් ඒත් ජෙනීෆර් ගෙදර යද්දිත් අම්මයි තාත්තයි ගමනක් ගිහින් තිබුනේ උණ හැමදේම ආච්චිට කියපු ජෙනීෆර් තමන්ගේ හිත නිදහස් කර ගත්තා.

පුතේ ඔයා ඒ ළමයගේ පස්සෙන් ගියේ නැද්ද?

එයා මොකක් හරි නරක දෙයක් කරගත්තොත්

අනේ මට හරි මහන්සියි ආච්චි එයා මට ආයෙත් බැන්නොත් මට කේන්ති යයි එහෙම වුණොත් මාත් එයාට බැනලා එයාගේ දුක තව වැඩි වෙයි.
හරි ජෙනී ඒකට කමක් නෑ එයා බැන්නත් ඔයා ඒ දේ කලේ හොඳ හිතින්නේ ඔයාට වරදින්නේ නෑ පුතේ
දන්නෙම නැතුව ජෙනීෆර්ට ආච්චිගේ උකුලෙම නින්ද ගිහින්. මේ වෙද්දි තවත් ගැහැණු ළමයෙක් කෙනෙකු හොයාගෙන පාක් එකට ඇවිල්ලයි හිටියේ.

Senu.. senu.. ඔයා කොහෙද ඉන්නේ?

Excus me.. අනේ මේ ෆොටෝ එකේ ඉන්නවා වගේ ගර්ල් කෙනෙක්ව දැක්කද?

යෙනුලි ඇහුවේ එතන හිටපු ආන්ටි කෙනෙක්ගෙන්

මේ ළමයද? ආ ඔව් මේ ළමයා අර ලොකු වාහනයකට හැප්පෙන්න ගියපු වෙලේ  තව ළමයෙක්  තමයි මෙයාව බේරගත්තේ

තමන් කිසිසේත් බලාපොරොත්තු නොවුන විදියේ උත්තරයක් ලැබුණ නිසා යෙනුලි ටිකක් ශොක් උනා.

පො.. පොඩ්ඩක් ඉන්න ඔයාට හොඳටම ශුවර්ද ඒ මෙයාමයි කියලා? එතකොට එයාව බේරගත්තේ කවුද?

ඒ බේරගත්තු ලමයව නම් මං මීට කලින් දැක්කල නෑ. ඒත් මට එහා පැත්තෙ තමයි ඒ ළමයා වාඩිවෙලා හිටියේ. එකපාරටම පාර පැත්තට ඒ ළමයා බයිසිකලෙන් වේගෙන් ගියා. ඊට පස්සේ ඇහුණු ලොකු සද්දෙට පස්සේ තමයි අපි දැක්කේ ඒ ළමයාගේ බයිසිකලේ අර ලොකු වාහනේට හැප්පිලා කැඩිලා තියෙනවා. අනේ මන්දා. ඒ ළමයා කොහොම අර ළමයව බේරගත්තද කියලා. මට මතක විදිහට කෙට්ටු, සුදු, උස අවුරුදු 12ක 13ක

ළමයෙක් වෙන්න ඕනි. ආ... මට මතකයි එයාගේ දකුණු අතේ මැණික් කටුව හරියේ birth mark එකක් තිබුණා.

හරි ආන්ටි එතකොට මේ ෆොටෝ එකේ ඉන්න ළමයා ඊට පස්සේ කොහෙද ගියේ?

ආහ්.. මේ ළමයා නම් අපි යද්දි අර ළමයටත් මොනවදෝ කියලා අඩ අඩා අර පැත්තට දුවලා ගියා

ඒ ඇන්ටිට ස්තූති කරපු යෙනුලි පුළුවන් තරම් වේගෙන් ගියේ ඒයා පෙන්නපු පාර පැත්තට ටික වේලාවකින් ලොකු වැස්සක් කඩන් වැටුනේ යෙනුලිව තවත් අසරණ කරමින්. පැයක් තිස්සේ යෙනුලි අඩ අඩා මුළු පාර පුරාම හෙව්වත් එයාට සෙනුව හම්බුනේ නෑ. ඉවසන්න බැරි දුකත් එක්කම යෙනුලි අඩ අඩා පාරේ ඉස්සරහට ඇදුනේ පරඬැලක් වගේ
අනේ සෙනූ ඔයා කොහෙද ඉන්නේ මට ගොඩක් මහන්සියි. අනේ ප්ලීස් තරහ අමතක කරලා අක්කා ළඟට එන්නකෝ..
ඔව් යෙනුලිනුලි මේ කතා කරන්නේ එයාගේ එකම නංගිට. එකපාරටම ගහපු ලොකු අකුණකට බය වුන යෙනුලි ඉක්මනට එන්නේ එතන තිබුණු ගහක් යටට .
මේ ගහ යටට ආපු යෙනුලිට එක පාරටම ඇහෙන්නේ ගහ පිටිපස්සෙන් ඉඳන් කවුරුහරි ඉකී ගහ ගහ අඬන සද්දයක් යෙනුලි හිමින් ගහ පිටිපස්සට ගිහින් බලද්දී එයා දැක්කේ අඩ අඩා හිටපු එයාගේ නංගිව ඔව් යෙනුලිට දැනුනේ මුළු ලෝකෙම  එයා ගාවට ආවා වගේ හැඟීමක්
අනේ සෙනු මට සමාවෙන්න තුෂී ගෙදර ගියා.  මං ඔයාට පොරොන්දු වෙනවා. ආයෙ මං එහෙම කරන්නේ නෑ මං ඔයාට විතරයි ආදරෙයි. අනේ ප්ලීස් අපි ගෙදර යමු.
මට බෑ ඔයා බොරු කාරියක් ඔයා තුෂීව ළඟට අරන් කතන්දර කියලා දුන්නා. එයත් එක්ක නිදාගත්තා එයාට බත් කැව්වා ඔයාට නිකමටවත් මාව මතක් උනේ නෑ මං ආයේ එන්නේ නෑ ඔයා ළඟට
තමන්ගේ එකම නංගි යෙනුලිට මේ කියන වචන එයාට දැනුනේ පිහි පාරවල් වගේ. ඒත් යෙනුලිට ඒවා ඉවසගෙන තමන්ගේ නංගිට ආදරයෙන් කතා කළා.

හරි සෙනු මං මේ ඇත්තමයි කියන්නේ මම ආය කවදාවත් තුෂීව මගේ ළඟටවත් ගන්නේ නෑ ඔයත් එක්ක විතරමයි ඉන්නේ. අනිත් ප්ලීස් ඩියර් මට ඔයා නැතුව ඉන්න බෑ .

ඔය ඇත්තමද ඔව් dear.. අනේ අපි යමුද නැත්නම් වැස්ස තව වැඩි වෙලා ඔයාට හෙම්බිරිසාව හැදෙයි

බොහොම අමාරුවෙන් තමන්ගේ නංගිව ගෙදර යන්න කැමති කරවගත්තේ යෙනුලි එයාගේ ජැකට් එකෙන් නංගිව වැස්සෙන් කවර් කරගෙන දෙන්නත් එක්කම වේගෙන් දුවලා ගියා .

මේ වෙද්දී ජෙනිෆර්ගේ ගෙදර තිබුණේ එකම කලබලයයි. ඔව් මොකද හෙට තමයි ජෙනිෆර්ව අලුත් ඉස්කෝලෙට බාර දෙන්නේ. ඒත් ජෙනිෆර් නම් කිසි දෙයක් ගණන් ගන්නේ නැතුව නිදාගන්න ගියා.

පසුදින උදයේ බලෙන්ම වගේ ජෙනිෆර් ලෑස්ති කරගත්තු ජෙනිෆර්ගේ අම්මයි තාත්තයි එයාවත් එක්කන් ගියේ ජෙනිෆර්ගේ අලුත් ඉස්කෝලෙට

ඔව් ඒක ලොකු ඉස්කෝලයක් වගේම මේක ජෙනිෆර්ටත් ටිකක් නුහුරු තැනක් උන නිසා ජෙනිෆර්ගේ හිතේ පුංචි කැළඹීමක් තිබුණා. අලුත් ළමයි , අලුත් ගුරුවරු හැමදේම අලුත් වගේ දැනෙද්දි ජෙනිෆර්ගේ ඔලුව තවත් අවුල් වුණා .

අම්මයි තාත්තයි ප්‍රින්සිපල් ඔෆිස් එකට ගිහින් කතා කර කර ඉද්දි ජෙනිෆර් එළියේ තිබුණු බංකුවකින් වාඩි වුණේ ජෙනීෆර් නිදහසේ ඉන්න කැමති නිසා. ඒත් එතනට ආපු කෙනෙක් ඒ වෙලාවේ ජෙනිෆන්ට පුංචි බාධාවක් කරනවා .

හායි මේ ඔයා නේද ඊයේ මාව බේරගත්තේ .

ටිකක් confused උන ජෙනිෆාටර් මුකුත් හිතාගන්න බැරි වුණා.

ඕ........ ඔව් මං තමයි ඒ කියන්නේ ඔයත් මේ ඉස්කෝලෙද?

ඔව් ඇත්තටම ඒ වෙලාවේ මං කියපු දේවල් වලට සොරි. මං ටිකක් අවුලෙන් හිටියේ ඒකයි ඒ වගේම ගොඩක් තැන්කියු මගේ ජීවිතේ බේරගත්තට

Ah.....its okay

මේ ඒක නෙමෙයි ඔයා අලුත් ළමයෙක් නේද ? මන් හය වසරේ ඔයා කීය වසරෙද ?

මං නමය වසරේ ඔයා...............

ජෙනිෆර්ට එයාගේ කතාව එතනින් නතර කරන්න වුණේ එයාගේ අම්මා ඇවිත් එයාට කතා කරපු නිසා

හරි මං එන්නම් එහෙනම් මං ගිහින් එන්නම් මං ජෙනිෆර් එතකොට ඔයා ?

මං සෙනුලි අපි එහෙනම් පස්සේ හම්බෙමුකෝ

සෙනුලිට සමුදුන්නට ජෙනිෆර් එතනින් යන්න ගියා

office එකට යන්න ආපු යෙනුලි දකිනවා සෙනුලි කවුරුහරි එක්ක කතා කර කර ඉන්නවා.

එයා යන දිහා බලන් ඉඳපු යෙනුලි සෙනුලිගාවට ආවා.

සෙනු ඔයා කාත් එක්කද ඒ කතා කර කර හිටියේ ?

ආ...හ්

එයා තමයි මාව එදා බේරගත්තේ එයා ඔයා වගේ මාව අතෑරියේ නෑ

අනේ සෙනු එදා ඔයා අඬාගෙන ගෙදරින් යද්දී මං ඔයාගේ පස්සෙන් ආවා. ඒත් ටවුන් එකට ආවට පස්සේ මට ඔයාව මගහැරුණා. එතන හිටපු අංකල් කෙනෙක් තමා කිව්වේ ඔයා පාක් එක පැත්තට ගියා කියලා

හරි හරි මොකක් හරි මං යනවා.

කියලා සෙනුලි යද්දී යෙනුලි office එකට ගියේ රෙජිස්ටර් එක තියලා එන්න. එතකොට තමයි යෙනුලි පළවෙනි වතාවට ජෙනී ෆර්ව දකින්නේ.

Oh…… මෙයාද සෙනුව බේරගත්තේ ඔව් මෙයා වෙන්න ඕනි

එහෙම හිතපු යෙනුලි යන්න ගියේ එයාගේ ක්ලාස් එකට. යෙනුලි එහෙම ගිහින් පැය කාලෙකට විතර පස්සේ එයාගේ පන්තියට ආවේ ජෙනී ජෙනිෆර් ඔව් මැඩම් ජෙනීෆර්ව පන්තියේ හැමෝටම අඳුන්වලා දෙද්දි ජෙනිෆර් ලස්සනට එයා දිහා හිනාවෙලා බලන් ඉන්න කෙනෙක්ව ඔව් ඒ තමයි යෙනුලි. යෙනුලි එහා පැත්තේ ඩෙස්ක් එක හිස්ව තිබුණු නිසා මැඩම් ජෙනීෆර්ට කිව්වේ එතනට ගිහින් වාඩිවෙන්න කියලා යෙනුලිව සත පහකට ගණන් නොගත්ත ජෙනිෆර් එතනට ගිහින් වාඩිවුණා. යෙනුලිටත් හරි පුදුම ජෙනිෆර්ගේ හැසිරීම ගැන

හෙලෝ...... මං යෙනුලි එතකොට ඔයා? ඔයා දිගටම අපේ පන්තියේ නේද? මොකක්ද ඔයාගේ ආසම සබ්ජෙක්ට් එක ඔයාගේ කලින් ඉස්කෝලේ මොකක්ද?

ආපු ගමන් ජෙනිෆර් තමන්ගේ පොත් ටික අස් කරගන්න හදද්දී යනුලිගේ මේ ඉවරයක් නැති ප්‍රශ්න නිසා ජෙනීෆර්ට ආවේ තරහා. ඔව් මොකද ජෙනිෆර් කැමති නෑ එයා වැඩක් කර කර ඉද්දි කවුරුත් එයාගෙන් ප්‍රශ්න කරනවාට ඒත් යෙනුලි අහපු කිසිම ප්‍රශ්නෙකට

උත්තර දීපු නැති ජෙනිෆර් යෙනුලිව ඇහුනෙවත් දැක්කෙවත් නැති ගානට ඉස්සරහ බලා ගත්තා .

කටකාර වගේම හොඳට ඉගෙන ගන්න පුළුවන් කාරුණික , සුහදශීලී කෙනෙක් තමයි ඒ යෙනුලි කියන්නේ. ඒ වගේම ප්‍රශ්න දාහක් මැද වුණත් අඩන්නැතුව ලස්සනට හිනාවෙන්න පුළුවන් කෙනෙක් තමයි යෙනුලි කියන්නේ. ඉතින් ජෙනිෆාර්ගේ මේ හැසිරීම එතරම් ගණන් නොගත්ත යෙනුලිත් පාඩමට අවධානය දුන්නා. ටික වේලාමකින් සිංහල පීරියඩ් එකක් ආවා. විනාඩි දහයකට විතර පස්සේ යෙනුලි හොරෙන් ජෙනිෆර් දිහා බලද්දි එයා දකින්නේ පොත බදාගෙන නිදන් ඉන්න ජෙනීෆර්ව

මේ............ මේ ............ නැගිටින අනේ මැඩම් දකී. අයියෝ නැගිටින්න අනේ.................

මැඩම් ටිකටික පාඩම කියව කියවා යෙනුලිලා ඉන්න දිහාවට එන්න ගද්දි යෙනුලි බැරිම තැන ජෙනිෆර් කෙනෙත්තුවෙන් ටිකක් තදින්

ආව්............. මොකක්ද වෙලා තියෙන්නේ ඔයාට

ජෙනිෆර් යෙනුලිට හයියෙන් කෑ ගැහුවේ එයා ඉන්නේ ක්ලාස් එකේ කියලත් අමතක වෙද්දි

ඔතන මොකක්ද වෙන්නේ ?

කියලා මැඩම් අහද්දි යෙනුලි බය වුණා. ජෙනිෆර්ට පළවෙනි දවසෙම බැනුම් අහන්න වෙයි කියලා.

සොරි මැඩ මම වැරදීමකින් එයාව කෙනිත්තුවා

එහෙම කියද්දී ළමයි හැමෝම යෙනුලිට හිනා වුණා වගේම මැඩම් යෙනුලි පන්තියෙන් එළියට දාන්නේ එයා ජෙනිෆාර්ට කරදර කරපු නිසා වගේම පාඩමට ඩිස්ටොප් කරපු නිසා.

පන්තියෙන් එළියේ ඉන්න යෙනුලි දිහා ජෙනිෆර් බැලුවේ හරි පුදුමෙන් ඔව් මොකද යෙනුලි තමා ජෙනිෆා කරපු වැරැද්දක් තමන් පිටට දාගත්තු පළවෙනි කෙනා ඒත් ජෙනිෆර්

යෙනුලිට මේ විදිහට සලකන්නත් ලොකු හේතුවක් තිබුණා. ඒක තමයි ජෙනිෆර් කැමති වුණේ නෑ එයාගේ පරණ යාලුවෝ අමතක කලා අලුත් යාළුවො හදාගන්න ඒ වගේම එයා බය වුණා හැමෝම එකතුවෙලා එයාව විහිළුවට ගනී කියලා.

කොහොම හරි සිංහල පීරියඩ් එක ඉවර වෙලා ඉන්ටවල් එක දුන්නා. යෙනුලි පන්තියට එද්දී එයා දකිනවා ග්‍රවුන්ඩ් එක පැත්තට යන ජෙනීෆර්ව එයාගේ පස්සෙන් හොරෙන්ම ගියපු යෙනුලි එයා බංකුවක වාඩිවෙලා කල්පනා කරනවා දැකලා ටිකකින් එයා ළඟට ගියා .

හායි......... හායි ...........මේ මං අනේ , ඇයි කියන්නකෝ මාත් එක්ක ඔය තරම් තරහා මම නම් ඔයාට ගොඩක් කැමතියි අපි දෙන්න යාළුවෝ වෙමුද? හොඳම යාළුවා හරි කමක් නෑ ..

යෙනුලිව ගණන් නොගෙන පැත්තක් බලන් හිටපු ජෙනීෆර් එයා අහපු අන්තිම ප්‍රශ්නෙටත් ජෙනුලි දිහා උඩ ඉඳන් පහළට බලලා යෙනුලිට හොරෙන් හිනාවෙලා ආයෙත් අහක බලා ගත්තා.

හරි හරි ඔයා ඒකට අකමැති නම් කමක් නෑ ඉතින් ඉතින් කියන්නකෝ ඔයාගේ පවුලේ අය ගැන හරි

මේ ප්‍රශ්නයට නම් ජෙනිෆර්ට තරහා ගියා. ඔව් මොකද එයාට එයාගේ පවුල කියද්දිත් හිතට එන්නේ ලොකු තරහක්

ඇයි? මොකක්ද ඔයාට වෙලා තියෙන්නේ ඇයි මෙතරම් වදයක් වෙවී මගෙන් පස්සෙන් එන්නේ මට පාඩුවේ ඉන්න දෙන්න

ජෙනීෆර්ගේ මේ වචන වලට නෙුලිට ඉබේම කඳුළු ආවා එතකොටයි ජෙනිෆර් කට වහගත්තේ

ආයෙම් සොරි ඇත්තටම මං ඔයාට මදයක් වෙන්න හිතුවේ නෑ කරදරයක් වුනානම් සමාවෙන මට ඕන වුනේ හොඳ යාළුවෙක් විතරයි

එහෙම කියලා යෙනුලි දුවලා ගියේ අඬ අඬම ජෙනීෆර්ට ඕනි උනේ නෑ යෙනුලිගේ හිත රිද්දන්න ඒත් නොදැනුවත්ම ඒ දේ වුන නිසාට ජෙනීෆර්ට ලොකු පසුතැවීමක් දැනුනා.

ඉන්ටවල් එක ඉවර වෙලා පැය බාගයක් ගියත් යෙනුලි තාම ආපු නැති නිසා ටිකක් කලබලින් හිටියේ. එතකොටම කෙනෙක් ක්ලාස් එකට ආවා. ඒ යෙනුලි කියලා හිතලා ජෙනිෆර් ඒ දිහා බැලුවත් ඒ යෙනුලි නෙමෙයි කියල දැක්කම ජෙනිෆර්ගේ හිතට දුකක් දැනුනා.

Jeni :- මේ ඔයා මෙතන හිටපු කෙනාව දැක්කද?

ආ.......... ඔව් එයාට ටිකක් අමාරු වෙලා සික්රූම් එකට අරන් ගියා.

Jeni :- ඇයි එයාට මොකද වුණේ?

ඒකනම් මං දන්නෙ නෑ?

ඒ ආපු ළමයා කියපු දේ නිසා ජෙනිෆර්ට බය හිතුනා. ඉස්කෝලෙ ඇරෙනකම් බලන් හිටපු ජෙනිෆර් මුලින්ම ගියේ සික්රූම් එකට. ඒත් ....එයා පරක්කු වැඩියි මොකද ඒ වෙද්දිත් යෙනුලි ගෙදර ගිහින්.

හිතේ තිබුණ ලොකු කණගාටුවත් එක්කම ගෙදර ගිහින් වොෂ්දාපු ජෙනිෆර් මුලින්ම එන්නේ ආච්චිගේ තුරුලට ඒ ඇවිත් උණ හැමදේම කියපු ජෙනිෆර්ට අද නම් හිතේ නිදහසක් තිබුනේ නෑ.

G.M :- ඇයි පුතේ ඔයා ඒ දොරුවට ඒ විදිහට කතා කළේ?

Jeni :- මට බය හිතුනා ආච්චි එයා අනිත් අයත් එක්ක එකතුවෙලා මාව විහිලුවට ගනී කියලා.

G.M :- හැම දෙයක් දිහාම සැකෙන් බලන්න එපා. පුතේ සමහර විට එයා ඔයාගෙන් එහෙම ඇහුවේ ඇත්තටම නම්.

Jeni :- හරි ආච්චි දැම් මම මොකද කරන්නේ?

G.M :- හෙට එයා ඉස්කෝලේ ආවහම ඔයා එයාගෙන් සමාව ගන්න. සමහරවිට එයා ඔයාට හම්බෙන හොඳම යාළුවා වෙන්නත් පුළුවන්

ආච්චිගේ අදහසට එකඟ වුණු ජෙනිෆර් පහුවදා ඉස්කෝලේ ගියේ ජෙනුලිගෙන් සමාව ගන්න අදහසින් ඒත් යෙනුලි එදා ඇවිත් හිටියේ නෑ. මේ විදියට සතියක් ගෙවිලා ගියා. යෙනුලි තවත්මත් ඉස්කෝලේ ආපු නැති නිසා හිටිය දුකෙන් වගේම ජෙනිෆර් ගැන ලොකු බයකින් කොහොම හරි සතියකට විතර පස්සේ ජෙනිෆර් ඉස්කෝලේ එද්දි එයා දකිනවා එහා පැත්තෙ ඩෙස්ක් එකේ තියෙන යෙනුලිගේ බෑග් එක ජෙනිෆර්ගේ හිතට දැනුනේ පුදුම සැනසීමක්. ඉක්මනින් ජෙනිෆර් එළියට ගියේ යෙනුලිව හොයාගෙන ඒ යද්දි එයා දකිනවා ඉස්කෝලේ ගහලා තිබුණු ලොකු බැනර් එකක් දිහා බලන් ඉන්න යෙනුලිව. යෙනුලි ලඟට ආපු ජෙනීෆර් එතකොට තමයි දකින්නේ, ඒ බැනර් එක

Jeni :- Oh ...........my goodness............ මේ........... මෙයා......කෝ...... කොහොමද මැරුණේ ?

Yenu :- Suiside කරගෙන ජෙනිලි කඳුළුපුරවන් එහෙම කියද්දී ජෙනීෆර්ට හිතාගන්න බැරි වුණා. මොකද මේ බැනර් එකේ ඉන්නේ සෙනුලි

Jeni :- මොකක්? සූසයිඩ් කරගන්න තරම් මෙයාට තිබුණ ප්‍රශ්නේ මොකක්ද ?
එදත් එහෙමයි,

Yenu :- එයා හිතුවේ එයාව කාටවත් වටින්නේ නෑ කියලා. ඒක නිසා එයා Suicide කරගත්තා

Jeni :- මුලින්ම තමන් තමන්ට වටිනාකමක් දෙන්න ඕනි. එහෙම උනොත් විතරයි අනිත් මිනිස්සු තමන්ට වටිනාකමක් දෙන්නේ ඕනේ.

Yenu :- ඇයි................ ඇයි.......... ඔයා මීට කලින් ඒක එයාට කිව්වේ නැත්තේ?

Jeni :- මොකක්ද ඇයි ඔයා අඬන්නේ?

Yenu :- ආ....හ්....නෑ.......... නෑ............ මුකුත් නෑ....... ඉතින් කොහොමද ඔයාට ?

Jeni :- මට නම් ප්‍රශ්නයක් නෑ ඒත් මට සමාවෙන්න එදා ඔයාට බැන්නට

Yenu :- ආ ඒකට කමක් නෑ........ අනේ......... දැන්වත් කියනවද ඔයාගේ නම මං ජෙනිෆර් ඔයා ?

Yenu :- මංයෙනුලි ඉතින් ඔයා කැමතිනම් අපි හොඳම යාළුවො වෙමුද?

Jeni :- ඔව් අනිවාර්යෙන්

Yenu :- ඉතින් කියන්නකෝ ඔයා ගැන

ඔව් මේ වචන ඇහෙද්දී ජෙනිෆර්ට දැනුනේ ලොකු සතුටක් මොකද දැන් එයත් එක්ක ජීවිතේ බෙදා ගන්නේ එයාට තව කෙනෙක් හම්බුනා.

Jeni :- එයාගේ ජීවිතේ හැම දෙයක්ම යෙනුලිට කිව්වා යෙනුත් ඒ දේවල් හොඳින් අහන්න ඉඳලා ජෙනිෆර්ගේ ඕනම දෙයකට යෙනුලි ඉන්නවා කියද්දි ජෙනිෆර්ට දැනුනේ ලොකු ශක්තියක්.

දින සති මාස ගෙවිලා ගියා ජෙනිෆර්යි යෙනුලී හොඳම යාළුවො උනා ජෙනිෆර් මුලදී දඟ වැඩ කළත් යෙනුලි හොඳින් අවවාද දීලා ජෙනිෆර් අකැමතිම සබ්ජෙක්ට් එකට වන සයන්ස් එයාට හොඳින් කියල දුන්නා. ටික දිග ජෙනිෆර්ගේ තිබුණ තද ගතිගුණ මගහැරිලා එයා හොඳ ළමයෙක් වුණා. ඔව් ඒ යෙනුලි නිසා අම්මා තාත්තා පවා ජෙනිෆර්ට ගොඩක් ආදරේ වුණා. ඉතින් මේ යෙනුලිව ජෙනිෆර්ට පෙනුනේ තමන්ගේ ජීවිතය ලස්සනට

වෙනස් කරපු සුරංගනාවියක් වගේ. ජෙනිෆයි ආච්චි හැම පෝයටම පන්සල් ගියා. යෙනුලි එනවා කිව්වම ආච්චිත් හැමදාම ජෙනිෆර් එක්ක පාර්ක් ගියා. ඔව්.මේ ගෙවෙන්නේ ජෙනිෆර්ගේ වගේම යෙනුලිගේ ජීවිතේ ලස්සනම කාලේ. ඒත් විටින් විට යෙනුලියි අසනීප වුණ එක ජෙනිෆර්ට ලොකු ප්‍රශ්නයක් වුණා. ඒත් යෙනුලි කොහොම හරි ඒ වෙලාවට ජෙනිෆර්ව ශේප් කරා.

ඉතින් දවසක් යෙනුලි ඉස්කෝලේ එද්දි ජෙනිෆර් ඇවිත් හිටියේ නෑ. මේ නිසා යෙනුලි ටිකක් කලබල වුනා. ඒත් එදා Parents Meeting එකට ඇවිත් හිටපු ජෙනිෆර්ගේ අම්මව යෙනුලි ගිහින් හම්බෙනවා.

Yenu :- Excuse me Aunty, මං යෙනුලි. ඇයි අද ජෙනිෆර් ඉස්කෝලේ ආවේ නැත්තෙ?

J.M. :- ආ එයාට හෙම්බිරිසාව හැදිලා පුතේ

Yenu :- අනේ එයාට අමාරුද ආන්ටි?

J.M. :- අනේ නෑ පුතේ. මං එයාට බෙහෙත් දීලා එයාට හෙට වෙද්දී සනීප වෙයි.

Yenu :- ආහ්.... එහෙමද ආන්ටි......මට ඔයාට පොඩි කතාවක් කියන්න තියෙනවා. අපි අර බංකුවට යමුද?

J.M. :- හරි යමු පුතේ..... ඉතින් කියන්නකෝ,

Yenu :- මේකයි ආන්ටි,

එහෙම කියල තමන්ගේ කතාව පටන් ගත්තු යෙනුලි කියපු හැම වචනයක් පාසා ජෙනීෆර්ගේ අම්මගේ ඇස් වලට ආවේ කඳුළු මිසක් සතුටක් නම් නෙමෙයි.

J.M. :- අනේ පුතේ ඇයි ඔයා මේ කතාව ජෙනිෆර්ට නොකීවේ.

Yenu :- අනේ ආන්ටි ඒ අතීතය මතක් වෙද්දි මට මං ගැනම ලොකු වරදකාරී හැඟීමක් දැනෙනවා. අනික ආන්ටි ජෙනිෆර් එක්ක ගත කරපු හැම මොහොතකම මන් හිටියේ ගොඩක් සතුටින්. ඉතින් මට ඒ සතුට නැති කරගන්න ඕන වුණේ නෑ.

J.M. :- හරි පුතේ ඒත් ඇයි ඔයා මේ ඉන්න අවදානම ගැනවත් එයාට නොකියන්නෙ.

Yenu :- මං කැමති නෑ ආන්ටි එයා මං නිසා දුකින් ඉන්නවට. අනික එයා ගොඩක් හොඳ කෙනෙක්. එයා ඔයාලා දෙන්නටත් ගොඩක් ආදරෙයි. ඒත් එයා ඒක පෙන්නන්නෙ නැත්තේ ඔයගොල්ලෝ එයාව ගණන් ගන්නේ නැති නිසා.

අනේ ප්ලීස් ආන්ටි, එයාව ආදරෙන් බලාගන්න. එයා මගේ නංගිගේ ජීවිතේ නිසා එයාගේ බයිසිකලෙත් නැති කරගත්තා. මට තියෙන්නේ තව ටික දවසයි. මං ගියාට පස්සේ අනිවාර්යෙන් එයාට මේ ලියුම දෙන්න. ඒත් මට පොරොන්දු වෙන්න මන් ඉද්දි කවදාවත් එයාට මේක දෙන්නේ නෑ කියලා.

J.M. :- මං පොරොන්දු වෙනවා දුව.

එහෙම කියලා ජෙනිෆර්ගේ අම්මා යෙනුලිව තුරුල් කරන් අඬන්න ගත්තේ දෙන්නගෙම හිත් ලොකු දුකකින් පිරෙද්දී.

ඉතින් මේ වෙද්දි තියෙන්නේ යෙනුලි එයි කියන බලාපොරොත්තුවෙන් ජෙනිෆර් පාක් එකට වෙලා බලාගෙනයි හිටියේ. ඒත් හවස් වෙන්නත් ඇවිල්ලා යෙනුලි තවම ආපු නැති නිසා ජෙනිෆර් ගෙදර එන්න පිටත් වුනා. ඒත් ජෙනිෆර් දැනන් හිටියේ නෑ මේ වෙද්දිත් යෙනුලි හිටියෙත් ගොඩක් අමාරුවෙන් තමන්ගේ ලෙඩෙන් පීඩා විඳින ගමන් කියලා. ඉතින් ජෙනිෆර් එද්දි එයා දකින්නේ හරි පුදුම දෙයක්. ඔව් එයා දකිනවා අම්මයි, තාත්තයි, ආච්චියි බයිසිකලයක් තියාගෙන එයා එනකම් බලාගෙන ඉන්නවා.

J.D. :- අනේ ජෙනීවා ඔයා ආවද? බලන්නකෝ මේක හොඳයිද කියල

ජෙනිෆර් ගොඩක් ආසාවෙන් ඒක අතගාල බැලුවේ ගොඩක් සතුටෙන්.

J.M. :- ඔයා සතුටින් නේද ජෙනිෆර්?

අම්මා ඒ විදිහට අහද්දි ජෙනීෆර් අම්මවයි තාත්තවයි ආදරෙන් වැළඳ ගත්තේ ජීවිතයේ පළවෙනි පාරට. අම්මයි තාත්තයි ආදරෙන් ජෙනිෆර්ගේ ඔලුව අතගාන දිහා ආච්චි පවා බලන් හිටියේ ලොකු සතුටකින්. ඒත් ජෙනිෆර් බය වුනේ එයාගේ පරන බයිසිකලය ගැන අහයිද කියලා. ඒක එහෙම නොවුන එක ජෙනිෆර්ට ගෙනාවේ සහනයක්. එදින රාත්‍රියේ ජෙනිෆර් නින්දට ගියේ පහුවදා මේ වුණ හැමදෙයක්ම යෙනුලිට කියන අදහසින්. ඒත් මේ වෙද්දිත් යෙනුලි දුන්න ලියුම ජෙනිෆර්ගේ අම්මයි තාත්තයි කියෙව්වේ ඇස්වල කඳුළු පුරවගෙන. පහුවදා ජෙනිෆර්ට ඉස්කෝලේ යන්න බැරි වෙන්නේ එයා ඊයේ පාක් එකට ගිහින් වැස්සෙම ගෙදර ආපු නිසා. ජෙනිෆර්ගේ හෙම්බිරිසාව ටිකක් වැඩි වෙලා තිබුන නිසයි. ඉතින් ගෙදර තනියම ඉන්න බැරි නිසා ආච්චි ජෙනීෆර්ගෙන් අහන්නේ පන්සල් යමුද කියලා. ඉතින් එක පයින්ම මේකට කැමති වුණු ජෙනීෆර් ආච්චිත් එක්ක ත්‍රීවිල් එකේ පන්සල් යන්න පිටත් වෙනවා. ඒ යන අතරමගදී මේගොල්ලෝ මුහුණ දෙන්නේ හරිම

අවාසනාවන්ත සිද්ධියකට. ඔව් ජෙනිෆර්ලා ගියපු වාහනේ වෑන් එකක හැප්පිලා ලොකු Accident එකක් වෙනවා!

ඉතින් ජෙනීෆර්ට සිහිය එද්දී එයා ඉන්නේ හොස්පිටල් එකේ. ඔව් එයා ළඟින්ම ඉන්නේ එයාගේ අම්මයි තාත්තයි. ඇක්සිඩන්ට් එකෙන් ජෙනිෆර්ගේ ජීවිතේට ලොකු ප්‍රශ්නයක් නොවුණත් ජෙනීෆර්ගේ ආච්චිගේ ඇස් දෙකට ලොකු හානියක් වෙලා තියෙනවා. ඔව් ඉක්මනින් ජෙනීෆර්ගේ ආච්චිට ඇස් දෙකක් බද්ධ කරන්න ඕනි. ඒත් මේ වෙලාවේ කොහොමද ආච්චිට ඇස් දෙකක් හොයාගන්න? මේ ප්‍රශ්න ගැන හිත හිත taxi එකෙකින් park එකට ආවේ යෙනුලි එයි කියන බලාපොරොත්තුවෙන්, ජෙනිෆර් park එකට වෙලා කල්පනා කර කර ඉද්දි එයා ළඟින්ම ඇවිත් වාඩි උනේ යෙනුලි. වුන හැමදේම යෙනුලිට කියපු ජෙනිෆර් ටිකක් පුදුම වුනේ යෙනුලිගේ හැසිරීම නිසා. ඔව් එයා ජෙනීෆර් තරම්වත් කලබල වෙලා නෑ, වෙනදට ජෙනිෆර් වචනයක් කතා කරද්දී වචන සීයක් කතා කරන කෙල්ල අද නිහඬයි. ඔව් එයා කරන්නේ ජෙනිෆර්ගේ මුහුණ දිහා හරි ආදරෙන් බලන් ඉන්න එක

Jeni :- යෙනුලි.....? ඇයි ඔයා අද ටිකක් අමුතු වෙලා

Yenu :- බයවෙන්න එපා ජෙනීෆර්, ඔයාගේ ආච්චිට ඇස් දෙකක් හම්බෙනවා

එහෙම කියපු යෙනුලිට එකපාරටම ලොකු කැස්සකුත් එක්ක කටින් ලේ එන්න ගත්තේ ජෙනීෆර්වත් පුදුම කරලා. ඒත් යෙනුලි හෙමීට ජෙනිෆර්ගේ ඔඩොක්කුවේ ඔලුව තියාගත්තා.

Jeni :- යෙ......යෙනුලි ඇයි මේ? අනේ අපි ඉක්මනට Hospital එකට යමු.... බයවෙන්න එපා. මං කොහොම හරි ඔයාව බේරගන්නවා..... මං ටැක්සි එකක් අරන් එන්නම්, ඔහොම ඉන්න.

Yenu :- එ.....පා.....එපා....... ජෙ.........ජෙනිෆර් මට මෙහෙම ඉන්න දෙ...න්න, ත....තව ටික වෙලාවයි මට තියෙන්නේ, ක්.....හ්.....ඔයා හොඳට ඉගෙනගෙන හොඳ කෙනෙක් වෙන්න ඕනි තේරුණාද? ම.....ට අමාරුයි ජෙනිෆර්, පුළුවන් තරම් ඉක්මනට මාව ඔයාගේ අම්මා ගාවට ගෙ.....ගෙනියන්න. ඒ...... වගේම මාව කවදාවත් අමතක....ක්...හ්.... කරන්න..... එපා.....

එහෙම කියපු යෙනුලි තමන්ගෙ අන්තිම හුස්ම හෙලන්නේ ජෙනිෆර්ගේ තුරුලේදීමයි.

යෙනුලි මේ වෙද්දිත් තමන්ව දාලා ගිහින් කියලා ජෙනිෆර්ට තේරුනත් එයාගෙ හිත මේ දේ පිළිගන්න අකමැති වුණා.

Jeni :- අනේ.... නෑ... නෑ.... යෙනුලි ඔයාට එහෙම යන්න බෑ, ඔයා බොරු නේද කරන්නේ, අනේ කතා කරන්නකෝ අපි දෙන්නා අද සෙල්ලම් කරන්නේ නැද්ද, ජෙනිෆර්ගේ කෑ ගැහිල්ලට එතනට ආපු මිනිස්සු යෙනුලිවයි, ජෙනිෆර්වයි දෙන්නවම දාගෙන ඉක්මනට ගියේ hospital එකට. යෙනුලි අන්තිම මොහොතේ කියපු විදිහටම ජෙනීෆර් යෙනුලිගේ body එක අම්මට දෙනව. ජෙනිෆර්ගේ අම්මත් අඬ අඬම ට්‍රොලියක දාගෙන යෙනුලිගේ body එක ගෙනිච්චේ eye donate එකට. මේ කිසි දෙයක් හිතාගන්න බැරිව ඉන්නේ ජෙනිෆර් ළඟට එන්නේ එයාගේ අම්මා.

J.M. :- ජෙනිෆර්.... පුතේ යෙනුලි මේක ඔයාට දෙන්න කිව්ව....

අම්මා දුන්න ලියුම ලොකු කලබලයකින් ජෙනිෆර් ඇරලා බැලුවා.

එහි මෙලෙස සටහන් විය.

Dear Jenifer......

ජෙනිෆර්, මං ඔයාගේ හොඳම යාළුවා යෙනුලි, මේක ඔයා කියවද්දි මං ජීවතුන් අතර නැතුව ඇති. මොකද මට අවුරුදු දෙකක ඉඳන් පිළිකාවක් තිබුණා ඒත් මං දැන් ඔයාට කියන්න යන්නේ මං ඔයාගෙන් හංගපු ලොකු කතාවක්. මට සමාවෙන්න මේක ඔයාගෙන් හැංගුවට ඒත් මට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ.

මගේ නංගි තමයි සෙනුලි. ඔව් එදා ඔයා බේරගත්ත ළමයා. එයාට මානසික ලෙඩක් තිබුණා. එයා හිතුවේ එයාගේ දේවල් එයාගේ විතරමයි කියලා. ඔව් එයා කැමති වුණේ නෑ මං එයාට වඩා තව කෙනෙක් එක්ක එකට ඉන්නවට. ඒක නිසා මට මෙච්චර කාලෙකට හොඳම යාලුවෙක් ඉඳලා නෑ. ඒත් ඔයා දන්නවද මගේ නංගි මගෙන් පස්සේ එයා ලෙන්ගතුකමින් කතා කරපු එකම ගෙනා ඔයා. මං හිතුවා අපි තුන්දෙනාට හොඳම යාලුවෝ වෙන්න පුළුවන් කියලා. ඒත් හරි ඉක්මනින් සෙනුලි අපිව දාලා ගියා. ඒක උනෙත් මගේ වැරද්දෙන් මගේ අම්මයි තාත්තයි හැමදාම ගෙදර එද්දී ගොඩක් රෑ වෙනවා. පුංචි කාලෙදි ඒ දෙන්නගේ ආදරේ මට ලැබුණත් මගේ නංගිට පුංචි කාලෙදීම ඒ දෙන්නගේ ආදරේ වැඩිපුර ලැබුණේ නෑ. ඒක නිසාමයි එයාට මේ වගේ ලෙඩක් හැදුනේ. පුංචි කාලේ

ඉඳන් එයාව හදා වඩාගත්තේ මම. ඒක නිසා එයා හිතුවා මාව අයිති එයාට විතරයි කියලා. එදා රෑ නංගිට මගේ ඔඩොක්කුවේම නින්ද ගිහින් තිබුණේ. අම්මා මගේ ළඟට ඇවිත් ඇහුවා ඒගොල්ලොත් එක්ක නිදාගන්න එනවද කියලා, මාත් ගොඩක් කැමැත්තෙන් නංගිත් එක්කක එන්න හදද්දී අම්මා කිව්වා නංගිව ඇහැරවන්න එපා, එයාට මහන්සී ඇති කියලා. ඒක නිසා එයාව තනියම තියලා මම ගියා. ඒත් උදේ එයා නැගිටලා මාව හොයද්දී තමයි මං අම්මයි තාත්තයි එක්ක ඉන්නවා දැක්කේ, ඒ වෙලාවේ  එයාට ආපු ශොක් එක නිසා එයා suicide කරගත්තා.

මේක මතක් වෙද්දි මට දැනුනේ වරදකාරී හැඟීමක් නිසයි මං මේක ඔයාට නොකීවේ. ජෙනිෆර් මන් නැති උනා කියලා ඔයා දුක් වෙන්න එපා. ඔයා මට කිව්ව නේද ඔයාගේ ආච්චිට ඇස් දෙකක් ඩොනේට් කරන්න ඕනි මොකද එයාගේ පෙනීම එන්න එන්න දුර්වල වෙනවා කියලා, ඉතින් ජෙනිෆර් අද මං කැමැත්තෙන්ම ආච්චිට මගේ ඇස් දෙක දෙනවා. ඔයා හැමදාම සතුටින් ඉන්න ඕනි. ළඟ නැතත් මං ඔයාගේ හදවතේ හැමදාම ඉන්නවා. ඔයා හොඳට ඉගෙනගෙන පුලුවන්නම් මනෝ වෛද්‍යවරයෙක් වෙන්න. මොකද මගේ නංගි වගේ මානසිකව පීඩා විඳින අයව ඔයාට හොඳ කරන්න පුළුවන් නම් ඒක ලොකු පිනක්.

ජෙනිෆර්, මගේ ජීවිතේ අන්තිම කාලෙදි හරි මට හොයාව හම්බුන එක ගැන මට ගොඩක් සතුටුයි. ඒ වගේම ඉක්මනට ඔයාව දාලා යන්න වෙන එක ගැන ගොඩක් දුකයි. මගේ ජීවිතේ ලස්සනම දවස් ගොඩක් ගෙවෙන්නේ ඔයත් එක්ක. අම්මයි, තාත්තයි, ආච්චි ඔයාට ගොඩක් ආදරෙයි. ඒගොල්ලන්ව හොඳින් බලාගන්න ඔයා තමයි මගේ පළවෙනි වගේම අන්තිම හොඳම යාළුවා. එහෙනම් මං යන්නම්. ඔයා පරිස්සමින් ඉන්න මාව කවදාවත් අමතක කරන්න එපා. ඔයාට බුදු සරණයි!

Your Best Friend
Yenuli

යෙනුලිගේ අම්මයි, තාත්තයි යෙනුලිගේ ඇස් දෙක ඩොනේට් කරන වැඩේට කැමැත්තෙන්ම කැමති වුනේ යෙනුලිගේ අන්තිම කැමැත්ත ඒක උන නිසා. ජෙනිෆර් ලියුම කියවලා ඉවර වෙනවාත් එක්කම ඩොක්ටර් එළියට ආවේ ආච්චිගේ ඔපරේෂන් එක සක්සස් කියාගෙන. මේ වෙලාවේදී ජෙනිෆර්ට හිතාගන්න බැරි උනේ තමන් සතුටු වෙන්නද දුක් වෙන්නද කියලා.

Jeni :- ඔයා කවදාවත් වැරදි නෑ යෙනුලි

ඔහු ජෙනිෆාගේ ජීවිතයේ තමන් කඩන් වැටෙන්න පුළුවන් උපරිම එයා වැටුණා. ඒත් ජෙනිෆර් වැටුනේ නෑ. ඔව් මොකද එයාට යෙනුලි වෙනුවෙන් සැබෑ කරන්න ලොකු හීනයක් තියෙනවා.

14 years later.

කාලය ඉක්මනින් ගතවෙලා ගියා. ජෙනිෆර්ට දැන් අවුරුදු 28ක්. එයාගේ ආච්චි තාමත් ජෙනිෆර්යි එක්ක ඉන්නවා. ඔව්. එයා තාමත් යෙනුලිගේ ඇස් දෙකෙන් මේ ලෝකේ දකිනවා. යෙනුලි එයාව දාලා ගියා කියා ගියා කියලා ජෙනිෆර් වෙනස් වුනේ නෑ. යෙනුලි එයාට කියලා දුන්න හැම හොඳ ගතිගුණයක්ම ජෙනිෆර් පිළිපැද්දා, එයා කිව්ව විදිහටම හොඳට ඉගෙන ගත්තා. ඔව් මේ වෙද්දි එයා යෙනුලිගේ හීනේ සැබෑ කරලා ඉවරයි. මේ වෙද්දී ජෙනීෆර්න් ප්‍රසිද්ධ මනෝ වෛද්‍යවරයෙක්. එයා මේ වෙද්දි මානසිකව විඳවන ගොඩක් අයව සුවපත් කරනවා. ජෙනිෆර්ගේ ජීවිතේ එයාට සිද්ධවෙන හැම දෙයක්ම වගේ එයා යෙනුලිගේ සොහොන ගාවට ගිහින් කිව්වා. ඔව් මොකද තවමත් ජෙනීෆර්ගේ හිතේ යෙනුලි ඉන්නවා. අදටත් ජෙනිෆර්ගේ ජීවිතේ හමුවුණු හොඳම හමුවීම යෙනුලි......

The End...

# පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු

වීමත් සමග සිදුවන සමාජ ආර්ථික

පරිවර්තනය හේතුකොටගෙන පොතපතින්

දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට

සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අතෙකින් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාව ශාස්ත්‍රීය වගකීම් ප්‍රදර්ශනාගාරයේ කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජාත්‍යන්තරයට ඩිජිටල් වේදිකාවට පිවිස හත්පතු අංකුර බවට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතීන් නිර්මාපක

2023.11.01